# කාර්යසාධන වාර්තාව

# 2018

# රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# දැක්ම

## ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

# මෙහෙවර

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම

සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත්

අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල

යහපාලනය ශක්තිමත් කිරීම

## පටුන


**1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය 1**

1.1 සමාලෝචනය 1

1.2 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 1

**2. 2018 වර්ෂය තුළ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ ප්‍රධාන කාර්යයන් 1**

2.1 යහපාලනය තහවුරු කිරීම 2

2.2 රජය සතු ව්‍යාපාරවල කාර්යසාධන අධීක්ෂණය 3

2.3 පොදු මහජන අභිලාෂය සුරැකීම 3

**3. රාජ්‍ය ව්‍යාපාරවල භෞතික කාර්යසාධනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය 4**

3.1 මහා භාණ්ඩාගාරයට අයබදු හා ලාභාංශ ගෙවීම 4

3.2 රජය සතු ව්‍යාපාර සඳහා අයවැය සහාය 4

3.3 ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය 4

**4. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය 4**

4.1 රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශ 4

**5. මානව සම්පත් කළමනාකරණය 17**

5.1 මාණ්ඩලික නිලධාරින්ගේ තොරතුරු - 2018 17

5.2 සංවිධාන සටහන 19

5.3 කාර්ය මණ්ඩල පුහුණු (දේශීය/විදේශීය) 2018 21

**6. මූල්‍ය කළමනාකරණය 23**

6.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 2018 23

**ඇමුණුම් 24**

ඇමුණුම I : රාජ්‍ය ව්‍යවසායයන්හි කෝප් රැස්වීම් සඳහා සහභාගී වීම 24

ඇමුණුම II: රාජ්‍ය ව්‍යවසායයන්හි වාර්ෂික වාර්තා භාර දීම 24

ඇමුණුම III: රාජ්‍ය වාණිජ ව්‍යසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ 25

ඇමුණුම IV: 2018.12.31 දිනට රජය සතු වාණිජ ව්‍යාපාර 54 හි මූල්‍ය තත්ත්වය 27

# 1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

## 1.1 සමාලෝචනය

රජය සතු ව්‍යාපාරයන්හි[1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ පරිපාලන II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මූල්‍ය පාලනය ස්ථාපනය කර ඇත.

රජය සතු ව්‍යාපාර, බලශක්තිය, ජලය, බැංකු හා රක්ෂණ, පොදු ප්‍රවාහන, ගුවන් සේවා හා ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. 2018 වසරේදී දළ ජාතික නිෂ්පාදිතය සඳහා රජය සතු වාණිජ ව්‍යාපාරවල දායකත්වය සියයට 13.26 කි.

රජය සතු ව්‍යාපාර 422ක් අතරින් ව්‍යාපාර 54 ක් රටේ ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහි ලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යාපාර[2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යාපාරවලින් 287 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරිය ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

2018 වසරේදී රජය සතු ව්‍යාපාර 54 ක් විසින් වාර්තා කරන ලද මුළු ආදායම රු. බිලියන 1,916.02 ක් වන අතර රජය සතු ව්‍යාපාර 37 ක් රු. බිලියන 130.66 ක ශුද්ධ ලාභයක් ද, රජය සතු ව්‍යාපාර 16 ක් රු. බිලියන 156.73 ක ශුද්ධ අලාභයක් ද[3] වාර්තා කර තිබුණි. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය වන රු. බිලියන 104 ද සමඟ සමස්තයක් ලෙස ගත් කල රජය සතු වාණිජ ව්‍යාපාර විසින් රු. බිලියන 26 ක අලාභයක් වාර්තා කර ඇත. රජය සතු වාණිජ ව්‍යාපාරවල වත්කම් පදනම 2017 රු. බිලියන 7,432.40 සිට 2018 දී වසරේදී රු. බිලියන 8,204.07 දක්වා සියයට 10 කින් වර්ධනය වී ඇත.

## 1.2 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාලව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

[1] ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.

[2] සේවා සහ භාණ්ඩ විකිණීම මඟින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතුවල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

[3] ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මූල්‍ය වාර්තා පිළියෙල කොට නොමැත.

# 2. 2018 වර්ෂය තුළ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ ප්‍රධාන කාර්යයන්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හිමිකාරීත්වය හා ක්‍රියාකාරිත්වය අනුව කොටස් හිමියන්ගේ කාර්යයන් හෝ අධීක්ෂණ කාර්යයන් ඉටු කරයි. ආයතනවල යහපාලනය තහවුරු කිරීම, කාර්යසාධන අධීක්ෂණය සඳහා ක්‍රමවේද ශක්තිමත් කිරීම සහ පොදු මහජන අභිලාෂය සුරැකීම යන කරුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම සිදු කරයි.

## 2.1 යහපාලනය තහවුරු කිරීම

අ) චක්‍රලේඛ නිකුත් කිරීම හා මාර්ගෝපදේශ සංග්‍රහ සඳහා සංශෝධන සිදු කිරීම

රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ අධීක්ෂණ හා සුපරීක්ෂක ආයතනයක කාර්යයන් හා වගකීම් ඉටු කිරීමේ ප්‍රමුඛතම විධික්‍රමයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්තිමය නියෝග, රාජ්‍ය ව්‍යවසාය පාලනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහාත් ප්‍රතිපත්ති උපදෙස් සහ මාර්ගෝපදේශ පැහැදිලි කිරීම සඳහාත් 2018 වර්ෂයේදී චක්‍රලේඛ තුනක් නිකුත් කරන ලදී. එම චක්‍රලේඛ මගින් ආවරණය කරන ප්‍රධාන ක්ෂේත්‍ර පහත පරිදිය.

- පී.ඊ.ඩී. අංක 01/2018 - රජය සතු ව්‍යාපාර සඳහා මෝටර් රථ ප්‍රසම්පාදනය
- පී.ඊ.ඩී. අංක 02/2018 - අතිරික්ත අරමුදල් ආයෝජනය
- පී.ඊ.ඩී. අංක 03/2018 - වර්ෂය සඳහා රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම

ආ) තවදුරටත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රතිපත්ති ඒකකය වසර තුළ විවිධ රාජ්‍ය ව්‍යවසායයන් විසින් ඉදිරිපත් කළ ප්‍රතිපත්තිමය කරුණු 200 කට වැඩි සංඛ්‍යාවක සඳහා ලිඛිතව පිළිතුරු ලබා දී ඇත. ඊට අමතරව ප්‍රතිපත්තිමය අංශයෙහි නිලධාරීන් රාජ්‍ය ව්‍යාපාරවල දෛනික ගැටළු සඳහා දුරකථන මාර්ගයෙන් උපදෙස් ලබා දීමෙන් රජය සතු ව්‍යාපාරවල පරිපාලනය ඉහළ නැංවීම සඳහා සහාය විය.

ඇ) වාහන මිලදී ගැනීම, විදෙස් සංචාර, අයවැය ප්‍රතිපාදන සහ මුදල් මුදාහැරීම් සඳහා නිර්දේශ ලබා දීම සහ රාජ්‍ය ව්‍යාපාර මඟින් රජයේ හෝ රජයේ නොවන පාර්ශ්ව සඳහා සිදු කරන අනුග්‍රාහකත්වය සඳහා නිර්දේශ ලබා දීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මඟින් බලය පවරනු ලැබ ඇති අවස්ථාවල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඒවා ක්‍රියාත්මක කරනු ලැබීය.

ඈ) 2018 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාරවල සභාපතිවරු සඳහා යහපාලනය පිළිබඳව සමුළුවක්ද, භාණ්ඩාගාර නියෝජිතයින් සඳහා රජය සතු ව්‍යාපාර වලට අදාළවත් රජයේ නීති රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

ඉ) 2018 වර්ෂයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලශක්ති මිල සංශෝධන ක්‍රියාන්විතය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා සම්බන්ධව කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර අරමුදල හා ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා මහජන උපයෝගිතා කොමිෂන් සභාව යන ආයතන සමඟ සම්බන්ධ වී දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඊ) මුදල් පනත, මුදල් රෙගුලාසි, හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට අනුකූලව රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා ක්‍රියාකාරකම් සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙතින් ලබා ගත යුතු අනුමැතීන් ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධව කටයුතු කරන ලදී. රාජ්‍ය ව්‍යාපාර විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සහ ඔවුන්ගේ ඉල්ලීම් සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිවලට ඇති අනුකූලතාවය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් පසු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය. මේ යටතට මූලධන වියදම් සඳහා අනුමැතිය ලබා දීම, ණය සීමා ඉහළ දැමීම, බදු සංශෝධන ආදිය ඇතුළත් වේ.

උ) 2018 වසරේදී රජයේ බදු නොවන ආදායම සඳහා රජය සතු වාණිජ ව්‍යාපාර විසින් අයබදු ලෙස රු. මිලියන 4,598 ක් ද ලාභාංශ ලෙස රු. මිලියන 37,230 ක් ද වශයෙන් රු. මිලියන 41,828 ක දායකත්වයක් ජාතික ආර්ථිකයට ලබා දී ඇත.

ඌ) මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන තවත් ප්‍රමුඛතම කාර්යයක් වන්නේ රාජ්‍ය ව්‍යාපාරවලට අදාළ කරුණු සම්බන්ධයෙන් විවිධ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පරීක්ෂාකාරීව අධ්‍යයනය කොට ඒ සම්බන්ධව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සකස් කිරීමයි.

## 2.1 වගුව 2018 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් මණ්ඩල පත්‍රිකා සඳහා වන නිරීක්ෂණ

| අංශය | කැබිනට් නිරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| සේවා | 115 |
| කර්මාන්ත | 53 |
| කෘෂිකර්ම | 40 |
| ප්‍රතිපත්ති | 15 |
| එකතුව | 223 |

*මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

එ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර මගින් නියමිත කාල රාමුව තුළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව පසුවිපරම් කරන අතර රජය සතු ව්‍යාපාරවල මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනවය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලබා දීම සිදු කරයි. 2018 වර්ෂය තුළදී පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ වගුව ඇමුණුම II වශයෙන් යා කර ඇත.

## 2.2 රජය සතු ව්‍යාපාරවල කාර්යසාධන අධීක්ෂණය

අ) 2017 වර්ෂයේදී අදාළ රජය සතු වාණිජ ව්‍යාපාරවල කළමනාකාරීත්වය, මුදල් අමාත්‍යාංශය සහ අදාළ රේඛීය අමාත්‍යාංශය පාර්ශවකරුවන් ලෙස ගෙන ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ගුවන්තොටුපොල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යන ප්‍රධානතම රජය සතු වාණිජ ව්‍යාපාර 5 ක් සඳහා ආයතන වල මූලික ක්‍රියාකාරකම් ඉලක්කගත මූලික කාර්යසාධන දර්ශක ඇතුළත් ත්‍රෛපාර්ශවික ගිවිසුමක් වන සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම අත්සන් තැබිණි. මේ වන විට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මෙම ආයතනවලට අදාළව සාමූහික අභිලාෂ ප්‍රකාශයන්හි අන්තර්ගත අරමුණු ළඟා කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය අධීක්ෂණයට අදාළව අමාත්‍ය මණ්ඩලයටසය මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

ආ) එසේම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා සතොස (පුද්ගලික) සමාගම, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය දැව සංස්ථාව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, මිල්කෝ (පුද්ගලික) සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන තෝරාගත් ආයතන දහය සමගද 2018 වසරේ ඔක්තෝම්බර් මස අවසන් වන විට සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම් අත්සන් තැබීමට සැලසුම් කර තිබුණ ද 2018 වසර අගභාගයේ රට තුළ පැවති අර්බුදකාරී දේශපාලන වාතාවරණය මත සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම් අත්සන් කිරීම කල් තැබිණි.

ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් කොටස්හිමියන්ගේ රැස්වීම්, වාර්ෂික මහා සභා රැස්වීම් සහ අධ්‍යාචනයක් මත කැඳවනු ලබන අති විශේෂ මහා සභා රැස්වීම් සඳහා සහභාගී වීමත් රජයේ ප්‍රතිපත්ති රාමුවට සමගාමීව රජය සතු ව්‍යාපාර වල කාර්යසාධනය සම්බන්ධව කළමනාකාරීත්වය සඳහා උපදෙස් ලබා දීම.

## 2.3 පොදු මහජන අභිලාෂය සුරැකීම

අ) ආයතනවල කාර්යසාධනය විශ්ලේෂණය කරමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කෝප් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් සකස් කරනු ලබයි. කෝප් කමිටුවේ මග පෙන්වීම්/නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා රාජ්‍ය ව්‍යාපාර විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව නිරන්තරව නියාමනය කරනු ලබයි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරින් කෝප් කමිටුවට සහභාගීවීම පිළිබඳ තොරතුරු “ඇමුණුම I” වශයෙන් දක්වා ඇත.

ආ) රාජ්‍ය ව්‍යාපාරයන්හි කොටස්කරුවන්ගේ රැස්වීම්, අධ්‍යාචනයක් මත කැඳවනු ලබන අති විශේෂ මහා සභා රැස්වීම් සඳහා මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහභාගී

වන අතර රජයේ ප්‍රතිපත්තිමය රාමුව අනුව යමින් එම ව්‍යාපාරයන්හි කාර්යසාධනය වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් කළමනාකරණය වෙත ලබා දෙන ලදී.

## 3. රාජ්‍ය ව්‍යාපාරවල භෞතික කාර්යසාධනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

### 3.1 මහා භාණ්ඩාගාරයට අයබදු හා ලාභාංශ ගෙවීම

2018 දී එකතු කරන ලද ලාභාංශ සහ අයබදු පිළිබඳ තොරතුරු ඇමුණුම III හි දක්වා ඇත.

**3.1. වගුව: අයබදු/ලාභාංශ ආදායම 2013-2018**




*මූලාශ්‍රය: රජය සතු ව්‍යාපාර*

### 3.2 රජය සතු ව්‍යාපාර සඳහා අයවැය සහාය

රජය සතු ව්‍යාපාරවල ව්‍යාපාර කටයුතු ප්‍රතිව්‍යුහගතකරණය සහ ප්‍රසාරණය සඳහා අයවැය ප්‍රතිපාදන ලෙස රු. බිලියන 73 ක් 2018 වර්ෂය තුළ ලබා දී ඇත.

### 3.3 ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර වෙතින් මූල්‍ය තොරතුරු එක් රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම කාලීනව සිදු කරනු ලබන අතර එම ප්‍රතිඵල මත පදනම්ව ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල සහ ඉහළ කළමනාකරණය සමඟ සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. ක්‍රමෝපායන් වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇමුණුම IV වශයෙන් දක්වා ඇත.

## 4. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය

**4.1 රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශ**

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| **බලශක්ති අංශය**<br><br>ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) | ලංකා විදුලිබල මණ්ඩලය සිය මෙහෙයුම් අලාභය රු. බිලියන 17 කින් අඩු කරගනිමින් සිය කාර්ය සාධනය යම් පමණකට වර්ධනය කර ගෙන ඇත. 2017 වර්ෂයේ වාර්තා කළ රු. බිලියන 47 ක මෙහෙයුම් අලාභය හා සසඳා බලන විට 2018 වර්ෂයේ රු. බිලියන 30 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත.<br><br>2017 වර්ෂයේ රු. බිලියන 2.5 ක්ව පැවති ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ප්‍රමාණය 2018 වර්ෂය අවසානය වනවිට රු. බිලියන | වර්ෂ 2030 වනවිට ද්‍රවීකෘත ස්වාභාවික වායු මගින් විදුලි උත්පාදනය සියයට 30 ක ප්‍රතිශතයක් කිරීමේ රජයේ ප්‍රතිපත්තියට සමගාමීව 2018 වර්ෂයේ ජුනි මාසයේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2018 - 2037 යන වර්ෂ දක්වා වූ දිගු කාලීන ජනන පුළුල් කිරීමේ සැලැස්ම සඳහා අනුමැතිය ලබා දී ඇත. |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| | 62 ක් දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී ඇත. කෙසේවෙතත්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට සහ නිදහස් විදුලි සැපයුම්කරුවන්ට ගෙවීමට තිබූ ණය ප්‍රමාණය රාජ්‍ය බැංකුවලින් ලබා ගත් ණය මඟින් පියවීම නිසා එම ණය ප්‍රමාණය අඩු වී ඇත. | එසේම, අධිකාර්යක්ෂමතා ගල් අඟුරු, ද්‍රවීකෘත ස්වාභාවික වායු, න්‍යෂ්ඨික බලය සහ දේශීය වශයෙන් පවත්නා ස්වාභාවික වායු ආදී සාම්ප්‍රදායික නොවන බලශක්ති ප්‍රභවයන් භාවිතා කිරීම සඳහා අවශ්‍ය දියුණු තාක්ෂණික ක්‍රමවේද සඳහා ආයෝජනය කිරීමට රජය විසින් යෝජනා කර ඇත. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලය සහ විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් රජයෙන් රජයට (G2G) පදනම යටතේ ද්‍රවීකෘත ස්වාභාවික වායු ව්‍යාපෘති ඇති කිරීම සඳහා අවශ්‍යක්‍රියාමාර්ග ගෙන ඇත. |
| ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | 2018 වර්ෂයේදී ඛණිජ තෙල් සංස්ථාවේ ශුද්ධ අලාභය වන රු. බිලියන 104 තුළ විනිමය අනුපාතික විචලනය වූ රු. බිලියන 82.7 ක ප්‍රමාණයද අන්තර්ගත වේ. ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියල අඛණ්ඩව අවප්‍රමාණය වීම, ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය කෙරෙහි ඍණාත්මකව බලපා ඇත. 2018 දී ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ විකුණුම් ප්‍රමාණය මිලියන ලීටර් 5,625.4 දක්වා වැඩි වී ඇති අතර, එය 2017 වර්ෂයේ විකුණුම් ප්‍රමාණය වන මිලියන ලීටර් 5,591.8 ක ප්‍රමාණයට සාපේක්ෂව සියයට 0.6 ක වර්ධනයකි.<br><br>කෙසේ වෙතත්, 2018 මැයි මස සිට පිරිවැය මත මිල තීරණය කිරීමේ සූත්‍රය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ 2018 වසරේ සමස්ත ආදායම සියයට 14 කින් ඉහළ ගොස් ඇත. නමුත් මෙම මිල සූත්‍රය මඟින් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු පිරිවැය ආවරණය නොවන හෙයින් එය ආයතනයේ මූල්‍ය තත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.<br><br>රාජ්‍ය ආයතනයන්හි ලැබිය යුතු බැරකම් නොලැබීම, ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම, ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු විදේශ මුදල් බැංකු ණය ප්‍රමාණය තවදුරටත් වැඩි වීම සඳහා හේතු වී ඇති අතර ලංකා බැංකුව හා මහජන බැංකුව මඟින් ලබා ගත් මුළු ණය ප්‍රමාණය 2017 වර්ෂයේ රු. බිලියන 224 සිට | වෙළඳපොල බලවේග හරහා අනාගතයේදී ඉහළ යා හැකි තෙල් මිළ ගණන් තුළින් ඇතිවිය හැකි බාහිර අවදානම් තුළින් රටේ සාර්ව ආර්ථික ක්‍රියාවලියට වියහැකි අහිතකර බලපෑම් අවම කර ගැනීම සඳහා රජය විසින් අවශ්‍ය කරන ප්‍රතිපත්ති තීරණ ගැනීම කාලෝචිත වේ.<br>බැංකු ණය සඳහා වන බැඳියාව ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ ලාභය කෙරෙහි තදබල බලපෑමක් කර ඇති බව පෙනී යයි. එබැවින් ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය කෙරෙහි වන අතිරේක පිරිවැය අඩුකල හැකි විකල්ප මූල්‍යන ක්‍රියාමාර්ග ලබා ගැනීමට ඇති හැකියාව සොයා බැලිය යුතුම ය. |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| | 2018 වර්ෂයේ රු. බිලියන 562 දක්වා වැඩි විය.<br><br>ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අහිතකර ශුද්ධ අලාභය වන රු. බිලියන 104 ක් දක්වා අහිතකර අයුරින් වර්ධනය වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් මෙහෙයුම් අලාභය වන රු.බිලියන 22 හා විනිමය අනුපාත විචලනය හේතුවෙන් උත්පාදිත අගය වන රු.බිලියන 82.7 එනම් අඛණ්ඩව ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් හා මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි ඍජු බලපෑමක් ඇති කර ඇත. | |
| **ජලය**<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | නව ජල සම්පාදන යෝජනා ක්‍රම 6 ක් හඳුන්වාදීමත් සමඟ නව සම්බන්ධතා 109,382 ක් එකතු කර 2018 අවසන් වන විට ජල සැපයුම් සම්බන්ධතා 2,328,654 ක් බවට පත්කර ඇත.<br><br>2017 වසරට සාපේක්ෂව සියයට 3.7 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් ජල සම්බන්ධතා මිලියන 2.3 ක් හරහා ජල සම්පාදන මණ්ඩලය විසින් ජලය ඝණ මීටර මිලියන 527 ක් ද ලබා දී ඇත.<br>2018 වර්ෂයේදී, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම වන රු.මිලියන 24,806 2017 වර්ෂයට සාපේක්ෂව ආදායමේ සියයට 4 ක වැඩි වීමක් වන අතර, 2017 වර්ෂයේදී මණ්ඩලයේ නිෂ්පාදන පිරිවැයේ වැඩිවීම සියයට 11 කි. .2017 දී මණ්ඩලය විසින් වාර්තා කල මිලියන 1,877 ලාභයට සාපේක්ෂව 2018 දී රු. මිලියන 568 ක සැලකිය යුතු අලාභයක් වාර්තා කරන ලදී. පුද්ගලික පිරිවැය සියයට 14 කින් සහ මූල්‍ය පිරිවැය සියයට 1,923 කින් වැඩි වීම මීට ප්‍රධාන හේතුවයි. නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මුළු වත්කම් 2017 වර්ෂයේ රු.මිලියන 441,143 ට සාපේක්ෂව 2018 දී රු.මිලියන 514,386 ක් පෙන්නුම් කරන ලදී.<br><br>2012 වර්ෂයේ සිට ගාස්තු සංශෝධනය නොකිරීමෙන් සමාගම මුහුණ දුන් ද්‍රවශීලතා ගැටලු සැලකිල්ලට ගනිමින් රජය විසින් ප්‍රාග්ධනය වශයෙන් රු. මිලියන 31,895 ක් භාණ්ඩාගාර ඇපකර සහ සහනදායී ලිපි ලෙස මණ්ඩලය වෙත ලබා දී ඇත. | 2020 වන විට සියයට 60 ක් දක්වා ජල ආවරණය ලබා ගැනීමේ අරමුණින් අන්තර්ජාතික මූල්‍ය සංස්ථා සහයෝගය සමඟ BOOT ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මණ්ඩලය විසින් නැගෙනහිර කොළඹ ජල හිඟය පිළිබඳ ගැටළු විසඳීම සඳහා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (PPP) යටතේ ප්‍රථම වරට වැලිවිට ප්‍රදේශයේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ගනුදෙනු උපදේශක ලෙස ලෝක බැංකුව කටයුතු කරයි. මීට අමතරව, 2018 වර්ෂයේදී විසල් දඹුල්ල, කතරගම පූජා නගරය හා විසල් කුරුණෑගල වැනි මහා පරිමාණ ජල සම්පාදන හා අපවහන ව්‍යාපෘති අවසන් කරන ලදී.<br>තවද, වත්කම් කළමනාකරණයට සහ ආදායම් නොලබන ජලය ප්‍රතිශතය සියයට 18 ක් දක්වා අඩු කිරීම, අධීක්ෂණය හා කළමනාකරණය සඳහා ක්‍රියාශීලී මැදිහත් වීමක් සහිතව ප්‍රාදේශීය ආධාර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, දිවයින පුරා ආදායම් නොලබන ජල ඒකක ස්ථාපිත කිරීම යන කරුණු සඳහා මණ්ඩලය පියවර ගෙන ඇත. කෙසේ වෙතත්, ඉලක්කගත ජල සම්පාදන හා අපවහන පද්ධති ආවරණය සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීම ප්‍රමාණවත් ආයෝජනයක් යටතේ සිදු කිරීමට මණ්ඩලය සමත්ව ඇත. |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| **මගී ප්‍රවාහනය**<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 2018 වර්ෂයේදී ශ්‍රීලංගමයේ මුළු මෙහෙයුම් ආදායම රු.මිලියන 30,823 දක්වා සියයට 9 කින් අඩුවී ඇති අතර වෙනත් ආදායම් රු. මිලියන 12,064 දක්වා සියයට 2 කින් අඩු වී ඇත. 2017 වසරේ කිලෝමීටර මිලියන 448 ක් වූ ධාවන කිලෝමීටර ප්‍රමාණය 2018 වසරේදී කිලෝමීටර මිලියන 446 ක් දක්වා අඩු වී ඇත. දිනකදී මෙහෙයුම් සඳහා යොදා ගන්නා බස්රථ ප්‍රමාණයේ සාමාන්‍යය 2018 වර්ෂයේදී සියයට 1 කින් අඩු වී ඇත.<br><br>2018 වර්ෂයේ ශ්‍රීලංගමයේ මුළු වියදම රු. මිලියන 39,957 දක්වා රු. මිලියන 3,447 කින් අඩු වී ඇති අතර 3,822 ක් වූ සේවකයින් සඳහා ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ආයතනයේ පොදු කාර්ය පිරිවැයෙහි සිදු වූ අඩුවීම මේ සඳහා මූලිකවම බලපා ඇත. 2018 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රීලංගමය වෙත රු. මිලියන 1,217 ක මූල්‍ය සහායක් ලබාදී ඇති අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 26 ක වර්ධනයකි. මේ අනුව, 2018 වර්ෂාවසානයේදී ශ්‍රීලංගමය විසින් රු.මිලියන 2,169 ක ලාභයක් වාර්තා කර ඇත. | ස්වයං වර්ධිත ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP) හරහා ශ්‍රීලංගමයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය අවම කර ගැනීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ක්‍රමෝපායික ව්‍යවසාය කළමනාකරණ නියෝජිත ආයතනය (SEMA) සහ මහා භාණ්ඩාගාරය මැදිහත් වීමෙන් ලාභ කේන්ද්‍රීය සංකල්පය සහ පවුල් හිමිකාරීත්වය පදනම් කරගත් උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්මක් සැකසීමට කටයුතු කර ඇත. මෙමගින් ශ්‍රී ලංගමයේ ලාභදායිත්වය 2019 වසරේදී හා ඉන් ඉදිරියට ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්යසාධන අධීක්ෂණය ශක්තිමත් කිරීමේ අරමුණින් මහා භාණ්ඩාගාරය, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව ත්‍රෛපාර්ශවීය සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය. |
| **ගුවන් සේවා**<br><br>ගුවන් තොටුපල හා ගුවන්සේවා සමාගම | බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ සහ මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළ වෙත පැමිණි ගුවන් යානා සංඛ්‍යාව ඉහළ යාමත්, ගුවන් මගී සංචලන හා ගුවන් යානයක් සඳහා වූ සාමාන්‍ය මගී සංඛ්‍යාව පිළිවෙළින් සියයට 7 ක්, 9ක් හා 2 ක් ලෙස ඉහළ යාමත් හේතුවෙන් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමෙහි මෙහෙයුම් කාර්යය සාධනය වැඩි වී ඇත. 2017 හා සසඳන විට ගුවන් සේවා හා ගුවන් සේවා නොවන ආදායම් පිළිවෙළින් සියයට 13.3 කින් හා සියයට 24.3 කින් ඉහළගොස් ඇත.<br><br>2018 වර්ෂයේ දී ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමෙහි පිරිවැය සියයට 67 ක් වූ ඉහළ අගයකින් වර්ධනය වී ඇත. කාර්යය මණ්ඩල පිරිවැය සියයට 16 කින් ඉහළ යාමත්, ණය පරිවර්තනය කිරීමේ විනිමය පාඩුව සියයට 435 ක් වීමත් මූල්‍ය | සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ සංචාරක සංවර්ධන අරමුදල මඟින් පිළිවෙළින් රු. මිලියන 900 ක් සහ රු. මිලියන 1,050 ක් වශයෙන් රු. මිලියන 1,950 ක අරමුදල් උපයෝජනය කරමින්, පලාලි ගුවන් තොටුපොළ ගෘහස්ථ ගුවන් තොටුපොළක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම මෙහි අනාගත මෙහෙයුම්කරු ලෙස කටයුතු කිරීමට නියමිතය.<br><br>බාහිර සාධකයක් වශයෙන් විනිමය අනුපාතික උච්චාවචනය වීමේ අවදානම දැනටමත් ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමේ මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපා ඇති බැවින්, එම |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
| --- | --- | --- |
| | පිරිවැය සියයට 52 ක් වීමත් මෙයට ප්‍රධාන ලෙසම හේතු වී ඇත. ඒ අනුව 2017 වර්ෂයට සාපේක්ෂව ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමෙහි බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 10,418 ක් දක්වා සියයට 3 කින් පහත බැස ඇත.<br><br>2018 වසර තුළ ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම විසින් ලබාගත් ණය ප්‍රමාණය රු. මිලියන 1,391 ක් වුවද, ණය පරිවර්තනය කිරීමේ විනිමය අලාභය රු. මිලියන 8,182 ක් වීම හේතුවෙන්, එම වසර තුළ ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමෙහි සමස්ත ණය ගැනීම් රු. මිලියන 6,428 කින් ඉහළ ගොස් ඇත. | තත්ත්වය අඩුකර ගැනීම සඳහා ආයතනය විසින් අඛණ්ඩව අවදානම් අඩුකර ගැනීමේ උපාය මාර්ග (risk mitigation Strategies) ක්‍රියාත්මක කළ යුතුය. |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් වාර්තා කළ රු. මිලියන 135,464 ක් වූ ආදායම ගුවන් මගීන් සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් 2018 වර්ෂයේදී රු.මිලියන 161,654 ක් දක්වා සියයට 18 කින් වැඩිවී ඇත.<br><br>ශ්‍රී ලංකා ගුවන් සමාගමෙහි ඉන්ධන පිරිවැය සාමාන්‍යයෙන් එහි මෙහෙයුම් පිරිවැයෙන් සියයට 32 ක් වන අතර, ගුවන් සේවා කර්මාන්තයේ සාමාන්‍ය ඉන්ධන පිරිවැය වන සියයට 21 වඩා ඉතා ඉහළ අගයක් ගනී. තවද, 2017/18 මූල්‍ය වර්ෂය තුළ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් ගුවන් යානා ඉන්ධන සඳහා රු.මිලියන 47,037.86 ක් වැයකර ඇති අතර, එය එම සමාගම ඉපයූ සමස්ත ආදායමෙන් සියයට 29 කි. ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි මෙහෙයුම් පිරිවැයෙන් සියයට 15 ක් කාර්යය මණ්ඩල හා ගුවන් යානා සේවක පිරිවැය වන අතර, එය ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි මුළු ආදායමෙන් සියයට 16 කි. කල්බදු පදනම මත ලබාගත් ගුවන් යානා සඳහා රු. මිලියන 25,726.29 ක කල්බදු වාරිකයක් ගෙවා ඇති අතර එය මුළු මෙහෙයුම් පිරිවැයෙන් සියයට 14 කි. සාමාන්‍යයෙන් යම් සමාගමක මෙහෙයුම් පිරිවැය විචල්‍ය ස්වාභාවයක් ගන්නා නමුදු, ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි මෙහෙයුම් පිරිවැය ස්ථාවර වියදම් වලින් සමන්විත බැවින් එම සමාගමේ මෙහෙයුම් උත්තෝලිතය (Financial Liverage) කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. | තවද, ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් ණය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකර හා ජාත්‍යන්තර බැඳුම්කර සඳහා ස්වෛරීත්ව ඇපකර නිකුත් කරන ලදී. රජය පසුගිය වර්ෂ දෙක තුළ අභ්‍යන්තර වශයෙන් උපයා ගත් ආදායම් යොදවා අඩු තරමින් එක් ණය වාරිකයක්වත් ගෙවා ගැනීමට නොහැකිවීමේ තත්ත්වයක් මත, ඉහත සඳහන් කරන ලද සියලු මූල්‍ය වගකීම් ශ්‍රී ලංකා රජයට දරා ගැනීමට සිදුවීමේ පැහැදිලි සම්භාවිතාවක් පවතී.<br><br>ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට අන්තර්ජාතික ගුවන් සේවා උපදේශකයන්ගේ ද සහාය මත දරන ලද උත්සාහයන්ද අසාර්ථක වූ අතර අලාභ අවම කරගැනීමට ද නොහැකි විය. එමෙන්ම වක්‍රාකාරයෙන් ආර්ථික වාසි රටට ලබා දුන් අගනා ගුවන් යානා නැවැත්වීමේ අංගන සහ ගුවන් පථ එම සමාගමට අහිමි වී ඇත.<br><br>අධික වැය බර දැරීමේ අවධානම අඩු කර ගැනීම සඳහා විචක්ෂණශීලී ප්‍රතිව්‍යුහගතකරණ උපාය මාර්ග අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් මතුව පවතී. මෙම අරමුණ සාක්ෂාත් කරගනු වස්, 2019 වර්ෂය ආරම්භයේදී අතිගරු |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| | | ජනාධිපති විසින් පත්කරන ලද විද්වත් කමිටුවේ යෝජනා ක්‍රියාත්මක කිරීමේ හැකියාව සැලකිල්ලට ගත යුතුවේ. |
| **වරාය අංශය**<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය | වරාය අධිකාරියේ පිරිවැය ව්‍යුහය 2018 වර්ෂයේදී සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇත. එනම් සෘජු වියදම් සියයට 5 කින්ද 2017 ජනවාරි මාසයේදී සාමූහික ගිවිසුම් අලුත් කිරීම නිසා වැටුප් හා වේතන සහ අතිකාල වියදම් පිළිවෙළින් සියයට 18 කින් සහ සියයට 25 කින්ද වැඩි වී ඇත. පරිපාලන කාර්ය මණ්ඩල වැටුප්, අතිකාල පිරිවැය සහ විවිධ වියදම් පිරිවැයෙහි වැඩිවීම හේතුවෙන් පරිපාලන වියදම් රුපියල් බිලියන 7.9 සිට රු. බිලියන 13.4 දක්වා සියයට 69 ක් තරම් ඉතා ඉහළ ප්‍රමාණයකින් වැඩි වී ඇත.<br><br>වර්ෂය තුළදී රුපියල අවප්‍රමාණය වීමෙන් සිදුවූ විදේශ විනිමය පරිවර්තන අලාභය වරාය අධිකාරියේ ලාභය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. 2017 වර්ෂයේදී රු. බිලියන 11.9 ක් වූ බදු පෙර ලාභය 2018 වර්ෂයේදී රු. බිලියන 4.2 ක් දක්වා සියයට 65 කින් ද 2017 දී රු. බිලියන 12 ක් වූ බදු පසු ලාභය 2018 දී රු. බිලියන 1.4 ක් දක්වා සියයට 88 කින්ද අඩු වී ඇත. | ධාරිතාව වැඩි කිරීම, කොළඹ වරාය සමග තරඟකාරීව ක්‍රියා කිරීම සඳහා අනෙකුත් වරායන් අතර තරඟකාරීත්වයෙහි ගතික වෙනසක් ඇති කිරීම සහ නාවික කර්මාන්තයෙහි සිදු වන්නා වූ වෙනස්කම් සඳහා උපායමාර්ගිකව ප්‍රතිචාර දැක්වීම යන කරුණු සම්බන්ධයෙන් අධිකාරිය විසින් නොයෙකුත් ක්‍රියාමාර්ගයන් ගෙන ඇත. |
| **ඉදිකිරීම් අංශය**<br><br>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | මෙම රාජ්‍ය ව්‍යාපාර රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සිදු කළද, රු. මිලියන 16,373 ක් වන ආයතන තුනෙහි මුළු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ සියයට 0.1 කි.<br><br>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ආදායම 2017 දී රු. මිලියන 3,130 ක් වූ අතර එය 2018 දී රු. මිලියන 3,176 ක් දක්වා සියයට 7 කින් ඉහළ ගොස් ඇති අතර, එහි වියදම් ද සියයට 3 කින් ඉහළ ගොස් ඇත. 2018 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව රු. මිලියන 1,024 ක අලාභයක් ලබා ඇති අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 9 ක වැඩි වීමකි. එමෙන්ම, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ රු. මිලියන 1,074 ක් වූ 2017 දී ලැබිය යුතු මුළු ලැබීම්, 2018 වර්ෂයේ දී රු. මිලියන 547 ක් දක්වා සියයට 49 කින් 2018 වර්ෂයේදී අඩු වී ඇත. | අලාභදායී තත්ත්වය ලැබීම සහ විවිධ හේතූන් මත රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු ලැබීම් පමා වීම යන කරුණු හේතුවෙන් සංස්ථාව ද්‍රවශීලතා හිඟයකට මුහුණ පා සිටී.<br><br>මෙම රජය සතු ව්‍යවසායන් නවීන ඉදිකිරීම් භාවිත සහ ක්‍රියාවලි සමඟ නව ආයෝජනයන් හරහා පෞද්ගලික අංශය සමඟ තරඟ කිරීම කාලීන අවශ්‍යතාවයක් වුවද රාජ්‍ය ආයතනවලින් කොන්ත්‍රාත් සම්පූර්ණ කිරීම සඳහා කළ යුතු ගෙවීම් පමාවීම හේතුවෙන් දිගුකාලීනව අලාභ ලැබීම නිසා මෙම ව්‍යවසායන් ද්‍රවශීලතා හිඟයනට මුහුණ පායි. |
| ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ 2017 වර්ෂය සඳහා රු. මිලියන 9,954 ක් වූ ආදායම 2018 දී රු. මිලියන 10, 128 ක් දක්වා සියයට 2 කින් වැඩි | |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| | වී ඇති අතර 2017 දී රු. මිලියන 633 ක් වූ ලාභය 2018 දී රු. මිලියන 531 දක්වා පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 16 කින් අඩු විය. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙහි මුළු ලැබීම් ප්‍රමාණය 2017 වර්ෂයේ රු. මිලියන 8,478 සිට 2018 වර්ෂය අවසානයේදී රු. මිලියන 6,494 ක් දක්වා අඩු වී ඇත. | |
| රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ 2018 වර්ෂයේ රු. මිලියන 3,069 ක් වන මුළු ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 21 කින් වැඩි වී ඇති අතර 2017 වර්ෂයේ මිලියන 12 ක් වූ ශුද්ධ ලාභය 2018 වර්ෂයේ රු. මිලියන 15 දක්වා වැඩි වී ඇත. ස්ථිර බැංකු ණය අයිරා පහසුකමක් සඳහා ආයතනය විසින් ලබා ගෙන ඇති රු. මිලියන 400 ක් වූ භාණ්ඩාගාර ඇපකරයේ වලංගු කාලය 2018.12.06 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. | |
| **බැංකු අංශය** | ශ්‍රී ලංකා රජයට අයත් වාණිජ බැංකු 2 සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 තවදුරටත් මෙරට බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛත්වය රඳවා ගනිමින් 2018 වර්ෂය අවසන් වන විට බැංකු ක්ෂේත්‍රයේ සමස්ත වත්කම්වලින් සියයට 44 ක් නියෝජනය කරයි. ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව යන බැංකු පමණක් රු. ට්‍රිලියන 5.04 කට වැඩි වත්කම් හිමිකාරිත්වයක් දරන අතර එය බැංකු අංශයේ මුළු වත්කම්වලින් සියයට 43 කි.<br><br>2018 අවසානය වන විට රාජ්‍ය බැංකුවල මුළු ණය කළඹ 2017 වසරට සාපේක්ෂව සියයට 25 ක වර්ධනයක් පෙන්වමින් රු. ට්‍රිලියන 3.5 ක අගයක පැවති අතර එය බැංකු ක්ෂේත්‍රයේ මුළු ණය කළඹින් සියයට 45 ක් නියෝජනය කරයි. 2018 අවසන් වන විට රාජ්‍ය බැංකුවල තැන්පතු පදනම සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු. ට්‍රිලියන 4.2 ක අගයක් වාර්තා කල අතර එය බැංකු ක්ෂේත්‍රයේ සමස්ත තැන්පතු පදනමින් සියයට 50 ක් වේ.<br><br>බාසල් III විධිවිධාන සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 2018 වර්ෂයේදී ලංකා බැංකුව සඳහා රු. බිලියන 5 ක ප්‍රාග්ධනයක් ලබාදී ඇත. 2016 වර්ෂයේ අයවැය යෝජනා අනුව, 2018.12.31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලංකාපුත්‍ර | බාසල් III විධිවිධාන සපුරාලනු හැකිවනු පිණිස ලංකා බැංකුවේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් 2018 වර්ෂයේ අයවැය යෝජනාවට සමගාමීව රු. බිලියන 5 ක ප්‍රාග්ධනයක් රජය විසින් බැංකුව වෙත සපයා ඇත. ෆිච් රේටින් ආයතනය විසින් AA+(lka) ජාතික දිගු කාලීන ශ්‍රේණිගත කිරීම ලංකා බැංකුව වෙත මෙවරත් ලබා දෙමින් 2018 වර්ෂය සඳහා බැංකුවේ ස්ථාවර ඉදිරි දැක්ම තහවුරු කර ඇත.<br><br>2018 වර්ෂය තුළදී මුදල් තැන්පතු යන්ත්‍රවලින් සමන්විත පාසල් බැංකු ඒකක, ස්වයං බැංකු ඒකක ආදී නව්‍යකරණයන් බැංකුව විසින් හඳුන්වා දෙන ලදි. 2018 වර්ෂයේදී ෆිච් රේටින් ආයතනය විසින් මහජන බැංකුව සඳහා AA+(lka) ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීම ස්ථාවර ඉදිරි දැක්මක් සහිතව තවදුරටත් තහවුරු කර ඇත.<br><br>බාසල් III විධිවිධාන අනුව ප්‍රබල ශේෂ පත්‍රයක් සඳහා ප්‍රතිපාදන සපුරා ගැනීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව 2018 වර්ෂයේ |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| | සංවර්ධන බැංකුව අත්පත් කරගන්නා ලදි. | නොගෙවූ තැන්පතු සංචිතය භාවිතා කරමින් කොටස් ප්‍රාග්ධනය රු. බිලියන 2.7 ක් දක්වා වර්ධනය කර ගෙන ඇත. ජාතික ඉතිරි කිරීමේ බැංකුව 2018 වර්ෂයේදී ෆිච් රේටින් ශ්‍රේණිගත කිරීමෙහි AAA (lka) ශ්‍රේණිය නොකඩවා 16 වන වරටත් පවත්වාගෙන ඇත. |
| **අලෙවිය හා බෙදාහැරීම්**<br><br>හොටෙල් ඩිවලොපර්ස් ලංකා පුද්ගලික සමාගම | හොටෙල් ඩිවලොපර්ස් ලංකා පුද්ගලික සමාගමේ ආදායම 2017 වසරේ පැවති රු. මිලියන 3,015 සිට 2018 වසරේ රු. මිලියන 2,910 දක්වා සියයට 3.4 කින් අඩු වී ඇත. 2017 වසරේ වාර්තා කළ රු. මිලියන 173 ක බදු පෙර ලාභය හා සසඳන විට 2018 මූල්‍ය වසර තුළ සමාගම විසින් රු. මිලියන 126 ක බදු පෙර අලාභයක් වාර්තා කර ඇත. | දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සෑම ස්ථරයකටම සරිලන පරිදි පහසු මිල පැකේජ නිර්මාණය කිරීම. |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | පෙර වසර හා සංසන්දනය කරන විට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2018 මුළු ආදායම සියයට 2 කින් පහළ ගොස් ඇත. ඒ අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය 2018 වසර තුළ රු. මිලියන 18 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර එය පෙර වර්ෂයේ ලාභයට සාපේක්ෂව සියයට 24 අඩු වීමකි. | සංචාරක ක්ෂේත්‍රයෙන් උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා ආකර්ෂණීය අලෙවි කුටි ස්ථාපිත කිරීම.<br>ආයතනයේ තිරසාරත්වය සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම. |
| රාජ්‍ය දැව සංස්ථාව | 2017 වර්ෂයේ වාර්තාගත ආදායම වූ රු. මිලියන 4,253 සාපේක්ෂව 2018 වර්ෂයේ ආදායම රු. මිලියන 4,069 දක්වා සියයට 4 ක අඩුවීමක් වාර්තා කර ඇත. මුළු ආදායමෙන් සියයට 64 ක් දැව කඳන් අලෙවියෙන් ලබා ඇත.<br><br>රාජ්‍ය දැව සංස්ථාවේ 2017 වර්ෂයේ මුළු වියදම වූ රු.මිලියන 1,486 ට සාපේක්ෂව 2018 වර්ෂයේ මුළු වියදම රු.මිලියන 1,680 දක්වා සියයට 13 කින් වර්ධනය වී ඇත. රු.මිලියන 322 ක් වූ වාර්ෂික ලාභයක් 2018 වර්ෂයේත් වාර්තා කරමින් රාජ්‍ය දැව සංස්ථාව තවදුරටත් ලාභදායී රාජ්‍ය ව්‍යවසායක් බවට පත් වී ඇත. කෙසේවෙතත්, රාජ්‍ය දැව සංස්ථාව සිය ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරීත්වයන් තුලින් 2018 වර්ෂයේ රු.මිලියන 8 ක ලාභයක් පමණක් වාර්තා කර ඇත.<br>රාජ්‍ය දැව සංස්ථාවේ මුළු ආදායමෙන් සියයට 52 ක් විකුණුම් පිරිවැය වූ අතර ඒ හේතුවෙන් 2018 වර්ෂයේ මෙහෙයුම් දළ ලාභය රු.මිලියන 1,965 ක් විය.<br><br>සංස්ථාව රජයේ ඒකාබද්ධ අරමුදලට අයබදු | ආයතනයේ නිපැයුම් සමූහය ප්‍රධාන වශයෙන් ගෘහභාණ්ඩ සහ ඉරූ දැව දක්වා විවිධාංගීකරණය කළයුතු බව<br><br>සේවක සංඛ්‍යාවේ සංශෝධනයක් සිදුකර නියමිත බඳවාගැනීමේ ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන් කාර්යක්ෂම ශ්‍රම බලකායක් තුලින් ආයතනයේ ලාභදායීත්වය වැඩි කිරීම<br><br>පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා තවදුරටත් අවධානය යොමුකරමින් කර්මාන්තයේ පැවැත්ම සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තුලින් වෙළෙඳපොළ ඉල්ලුම සපුරාගැනීම සහ ඒ අනුව වැඩි ලාභ ලබාගැනීම. |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| | ගෙවීම හරහා දායකත්වය ලබාදෙන අතර 2018 වර්ෂයේ රු. මිලියන 100 ක් අයබදු ගෙවීම මඟින් එම දායකත්වය ලබා දී ඇත. | |
| ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාව | පෙර වසර හා සංසන්දනය කරන විට 2017/18 මූල්‍ය වර්ෂයේ දී මුළු ආදායම සියයට 16 කින් වර්ධනය වී ඇත. 2018 වර්ෂය තුළ රු. මිලියන 88 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට ආයතනය සමත් වූ අතර, 2017 හා සැසඳීමේ දී බදු පෙර ලාභයේ සියයට 94 ක කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබේ. | වෙළඳපොළ ඉල්ලුම අනුව නිෂ්පාදනයන් හඳුනා ගැනීම, ප්‍රචාරණය කිරීම තුළින් නිෂ්පාදන සඳහා නව උපාය මාර්ගයන් සෙවීම. |
| රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | පාසැල් පෙළපොත් මුද්‍රණය සහ ලිපිද්‍රව්‍ය මුද්‍රණ මඟින් ලැබූ ආදායම අඩුවීම හේතුවෙන් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ ආදායම සියයට 27 කින් අඩු වී ඇත. ඒ අනුව, 2017 වර්ෂයේ අලාභය වූ රු.මිලියන 243 ට සාපේක්ෂව 2018 වර්ෂයේ බදු පෙර අලාභය රු.මිලියන 406 දක්වා වර්ධනය වී ඇත. මූල්‍ය පිරිවැය සහ පරිපාලන වියදම් වර්ධනය වීමද අලාභය වර්ධනය වීමට බලපෑ අනෙක් හේතු සාධක වේ. | සංස්ථාවේ මූල්‍ය පිරිවැය අඩුකරගැනීමට සහ ලාභදායීත්වය වර්ධනය කරගැනීම සඳහා කාරක ප්‍රාග්ධන කළමණාකරණය තවදුරටත් වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.<br><br>රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව ලාභදායී ව්‍යාපාරයක් බවට පත්වීම සඳහා ව්‍යාපාරික ක්‍රමෝපාය ආකෘතියක් සකස්කිරීම, සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම සහ නියමිත බදවා ගැනීමේ ප්‍රතිපත්ති හඳුන්වාදීම අවශ්‍ය වේ. |
| **රක්ෂණ අංශය**<br><br>ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2018 වසරේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආදායම රු. මිලියන 43,883 ක් වූ අතර එය පෙර වසරේ රු. මිලියන 39,400 ට සාපේක්ෂව සියයට 11.4 ක ඉහළ යාමකි. 2017 වසරේ දළ ලිඛිත වාරික අගය වූ රු. මිලියන 31,438 ට සාපේක්ෂව 2018 වසරේ දළ ලිඛිත වාරික අගය රු. මිලියන 31,727 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 0.95 ක සුළු වර්ධනයකි. ජීවිත රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 13,206 ක් ලෙස වාර්තා කළ අතර මෙය පෙර වර්ෂයේ රුපියල් මිලියන 12,517 ට සාපේක්ෂව සියයට 5.5 ක වර්ධනයකි. එසේම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරික ආදායම 2018 වසරේ රු. මිලියන 18,521 ක් වාර්තා කළ අතර එය 2017 වසරේ රු. මිලියන 18,921 ට සාපේක්ෂව සියයට 2.1 ක පසුබෑමක් ලෙස වාර්තා වේ. 2018 වසර තුළදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු. මිලියන 1,856 ක් අය බදු වශයෙන් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත. | පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට සහ රක්ෂණ කර්මාන්තයේ පවතින දැඩි තරඟකාරී බවට මුහුණ දිය හැකිවන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නව රක්ෂණ ක්‍රම අඛණ්ඩව වැඩි දියුණු කල යුතුය. |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
| **පශු සම්පත්**<br><br>මිල්කෝ පුද්ගලික සමාගම | මිල්කෝ සමාගම 2017 වසරේදී එකතු කරන ලද නැවුම් කිරි ලීටර් මිලියන 96 ට සාපේක්ෂව 2018 වසරේද එකතු කරන ලද නැවුම් කිරි ලීටර මිලියන ගණන 91 කි. එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 5 ක අඩුවීමකි. සමාගම 2017 වසරේදී දියර කිරි ලීටරයක් සඳහා ගෙවා ඇති රු. 68.52 ක ඒකක මුදලට සාපේක්ෂව 2018 වර්ෂයේදී නැවුම් දියර කිරි ලීටරයක් සඳහා රුපියල් 68.71 ක මුදලක් ගෙවා ඇත. නවීකරණය කරන ලද දිගන, පොළොන්නරුව සහ අඹේවෙල කිරි සැකසුම් කර්මාන්තශාලා තුනෙහි කිරි ආශ්‍රිත නිෂ්පාදන ධාරිතාවය ඉහළ යාම සහ නිෂ්පාදන විවිධාංගීකරණය යන කරුණු හේතුවෙන් පසු ගිය වසරට සාපේක්ෂව 2018 වර්ෂය තුළ සමාගමේ විකුණුම් සියයට 13.33 කින් පමණ ඉහළ ගොස් ඇත. | 2019 වර්ෂය තුලදී මහා භාණ්ඩාගාරය, මිල්කෝ (පුද්) සමාගම සහ අදාළ රේඛීය අමාත්‍යාංශය අතර සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම (SCI) අත්සන් කිරීමට යෝජිත අතර එය රජයේ ප්‍රතිපත්තිමය රාමුව තුළ එකඟ වූ කාලසීමාවක් තුල මිල්කෝ (පුද්) සමාගමේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්‍යසාධනය ඉහළ නැංවීම සඳහා වන ක්‍රමවේදයක් වේ. |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 2017 වර්ෂයේ වාර්තා කර ඇති රු. මිලියන 840 ක අලාභය හා සසඳන විට ජාතික පශු සම්පත් සහ සංවර්ධන මණ්ඩලය 2018 වර්ෂයේදී රු. මිලියන 512 ක අලාභයක් වාර්තා කර ඇත. පසු ගිය වසරට සාපේක්ෂව 2018 වර්ෂයේදී ජාතික පශු සම්පත් මණ්ඩලයේ සම්පූර්ණ වියදම සහ පිරිවැටුම පිළිවෙලින් සියයට 2.3 කින් සහ 7.7 කින් පහළ ගොස් ඇත. | වර්තමානයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්වලට අමතරව රු. මිලියන 28.36 ක් වැය කරමින් වැලිසර ගොවිපල තුල කිරි නිෂ්පාදන සැකසීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ රු. මිලියන 12.2 ක් වැය කරමින් සූකර, ගව සහ බැටළු ශුක්‍රාණු ආනයනය කිරීම වැනි වැඩසටහන් කිහිපයක් 2018 වර්ෂයේදී ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් ක්‍රියාවට නැංවීම ආරම්භ කරන ලදි. |
| **වැවිලි අංශය** | ජ.න.ව.ස.ම, ශ්‍රී ලං.රා.වැ.ස. සහ ඇල්කඩුව වැවිලි සමාගම සතුව පිළිවෙළින් වැවිලි ඉඩම් හෙක්ටයාර 11,695 ක්, 11,757 ක් සහ 4,083 ක් පවතින අතර ජ.න.ව.ස.ම, ශ්‍රී.ල.රා.වැ.ස සහ ඇ.වැ.ස, තේ සහ රබර් කර්මාන්තයේ නියැලී සිටී. කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම යටතේ කළුබෝවිටියාන, මැණික්දිවෙල, දැරංගල හා හිණිදුම යන තේ කර්මාන්තශාලා 4 ක්‍රියාත්මක වේ. කුරුණෑගල වැවිලි සමාගම සහ හලාවත වැවිලි සමාගම පිළිවෙළින් පොල් ඉඩම් හෙක්ටයාර් 4,002.5 ක් සහ හෙක්ටයාර් 3,804 ක් කළමනාකරණය කරනු ලබයි.<br><br>2018 වර්ෂයේදී කුරුණෑගල වැවිලි සමාගමේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 12.5 ක් විය. සමාගම විසින් භාවිතා කරනු ලබන ඉඩම්වලින් සියයට 80 ක් පොල් වගා | ඉඩම් භාවිතයේ ඵලදායිතාවය නැංවීමේ අරමුණින් කුරුණෑගල වැවිලි සමාගම එම සමාගම විසින්ම සිදුකරනු ලබන අතුරු භෝග වගා කිරීමේ වැඩසටහන් හා බාහිර වගාකරුවන් සම්බන්ධ කරගනිමින් සිදුකරන අතුරු බෝග වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර එමඟින් 2018 වර්ෂයේදී රු. මිලියන 25 ක් උපයාගෙන ඇති අතර එය මුළු ආදායමින් සියයට 4 කි.<br><br>එමෙන්ම කුරුණෑගල වැවිලි සමාගම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගෙන ඇති අතර එමගින් මෙම |

| අංශය | රජය සතු වාණිජ ව්‍යාපාර කාර්යසාධනය | නිර්දේශ |
|---|---|---|
